# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 67 දරන

# විදුලි සන්දේශ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 නොවැම්බර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 නොවැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 20 යි　　　　තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 67 දරන විදුලි සන්දේශ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 නොවැම්බර් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 21/79.

විදුලි සන්දේශ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1979 අංක 67 දරන විදුලි සන්දේශ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

192 වන අධිකාරයෙහි 42අ වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) විදුලි සන්දේශ ආඥාපනතෙහි, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 17 දරන පනතින් ඇතුළත් කරන ලද 42අ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "රාත්තල් විස්ස හා තුන්සියය අතර වූ" යන වචන වෙනුවට "රාත්තල් හතර හා තුන්සියය අතර වූ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42ආ වගන්තිය සංශෝධනය කිරීම

3. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 17 දරන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරන ලද 42ආ වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියෙහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) 42අ හෝ 42ආ වගන්තිය යටතේ යම් වරද කට යම් තැනැත්තකු වරදකරු කරනු ලබන විට (1) වන උපවගන්තිය යටතේ පනවනු ලැබිය යුතු වෙනත් දණ්ඩනයකට අමතරව ඒ වරද කිරීමෙහි ලා හෝ ඒ වරද කිරීම සම්බන්ධයෙන් හෝ පාවිච්චි කරන ලද යම් වාහනයක් ජනරජය සන්තක විය යුතු යයි ප්‍රකාශ කරමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.